සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜட இண கஜபகஷகப்ல் - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 02 |

නම
நகஅஉஷ
Name ................................................

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

(1) (i) පහත දැක්වෙන අක්ෂර භාවිත කරමින් අර්ථවත් වචනය බැගින් ලියන්න.

(අ) ඍ (ආ) ඣ

(ii) පහත දැක්වෙන අනුක්ත පද නිවැරදි ව වාක්‍යවල යොදන්න.

(අ) මා (ආ) සගයන්

(iii) ''ළමයෝ ඉක්මනට ගෙදර දුවපන්, අපි අද මෙහි රෑ නතර වෙනවා.''

මෙම ප්‍රකාශයෙහි ඇතුළත්

(අ) විධි ක්‍රියා පදයක් (ආ) උත්තම පුරුෂ උක්ත පදයක්

ලියන්න.

(iv) පහත දී ඇති පදවල විරුද්ධාර්ථවත් පද ලියන්න.

(අ) අර්ථපූර්ණ (ආ) දෘශ්‍යමාන

(v) ''නරමුල් ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ'' මෙම පද්‍ය පාදයෙහි සඳහන්

(අ) උපමානය (ආ) උපමේය ලියා දක්වන්න

(vi) කාව්‍ය නිර්මාණකරණයෙහි දී යෙදෙන පහත දැක්වෙන කියමන් අර්ථ දක්වන්න.

(අ) ප්‍රතිභාව (ආ) වාක්කෝෂය

(vii) මෙම ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර සපයන්න.

(අ) පුන්නච්චා (ආ) බූන්නා

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) පෙර දා වට වැස්සෙන් නදී තොමෝ ප්‍රචණ්ඩ වූහ.

(ආ) සියලු ශිෂ්‍යයෝ විභාගය සමත් වීම යෙහෙකි.

(ix) දී ඇති කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයටත් හරවන්න.

(අ) නීතිඥයන් විසින් තම සේවාදායකයෝ දැනුවත් කරන ලදහ.

(ආ) බුද්ධිමත් මිනිස්සු සොබා දහම ආරක්ෂා කරති.

(x) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන පිරුළු ලියන්න.

(අ) පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම.

(ආ) අරමුණකින් තොර ව වැඩ කිරීම.

(ලකුණු 20 යි)

(02) පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) විස්තර අතුරින් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) වැඩිහිටියන් අතර පමණක් නොව දරුවන් අතර ද විටින් විට මතු වන ප්‍රචණ්ඩ හැසිරීම් හා කුරිරුකම් පිළිබඳ ව අපට අසන්ට ලැබේ. එසේ වී ඇත්තේ මිනිසුන් තුළ දයාව, කරුණාව, ඉවසීම, මැදිහත් බව යන උතුම් ගුණාංග පිරිහී තිබීම නිසා ය. මෙම තත්ත්වය දිගින් දිගට ම පැවතුන හොත් ආධ්‍යාත්මයෙන් සිස් වූ අසත්පුරුෂයන්ගෙන් පිරුණු සමාජයක් බිහිවෙනවා නො අනුමාන ය. මෙය මගහරවා ගැනීම සඳහා සියලු පාසල්, ආගමික ආයතන හා ප්‍රජා සංවිධාන තම යුතුකම් හා වගකීම ඉටු කළ යුතු කාලය එළඹ තිබේ.

(ආ) ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගෙන් බොහෝ දෙනෙකු දියවැඩියා රෝගයෙන් පෙළෙන බව මෑතක දී අනාවරණය විය. දේශයේ අනාගතයට උර දීමට සිටින මේ තරුණ පුරවැසියන් මෙබඳු බෝ නොවන රෝගවලින් පෙළීම අභාග්‍යයකි. උදේ ආහාරය මග හැරීම, ව්‍යායාම අඩුකම, අවිවේකී බව මෙයට සමාසන්න හේතු සේ ප්‍රකට ය. මේ ජාතික ව්‍යසනය අවම කර සෞඛ්‍ය සම්පන්න සිසු පරපුරක් බිහි කර ගත හැකි ප්‍රායෝගික උපාය මාර්ග අවශ්‍ය වේ.

(ඉ) ආපදා ඕනෑ ම දේශයකට, ව්‍යාපාරයකට හෝ පුද්ගලයෙකුට පොදු ය. අපේ රට කුඩා වුවත් ඊට ම ප්‍රමාණවත් ආපදා වරින් වර සිදුවුණි. මෙසේ ආපදාවල පෙනෙන හෝ නොපෙනෙන බලපෑම් මගින් සිදුවන සෑම අගතියක් ම රටේ පිරිහීමට බලපායි. මේවා අවම කර ගැනීම සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම කාලයත්, ශ්‍රමයත්, ධනයත් ඉතිරි කර ගැනීමකි.

(ඊ) මීට දශක කිහිපයකට පෙර අප රටේ පොදු ජනයාට තම විවේකය අර්ථවත් අයුරින් ගෙවීමටත් විනෝදාස්වාදය සැපයීමටත් පැවති ජනමාධ්‍ය වූයේ පුවත්පත් සහ ජාතික ගුවන් විදුලියයි. හරවත් ශාස්ත්‍රීය සංවාද, කතු වැකි, කෙටිකතා, ගුවන්විදුලි රඟමඩල,සුභාවිත ගීත, විනෝද සමය වැනි වැඩ සටහන් ජනතාව අමන්දානන්දයට පත් කළේ ය. නූතන ජනමාධ්‍ය මේවායින් පූර්වාදර්ශ ලබා ගන්නේ නම් එය ජාතියේ වාසනාවකි.

(ලකුණු 25 යි)

(03) පහත දැක්වෙන ඡේදය වචන 50-60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන ගණන උත්තරය අග ලියන්න.

ලේඛකයෙකු කෙටිකතාවක් රචනා කිරීමේ දී ඔහු තුළ පිළිසිඳ ගත් කිසියම් අදහසක් පාදක කරගන්නේ ය. මෙයට අපි ''අත්දැකීම්'' යයි කියමු. එය ම අනුභූතිය ලෙස ද හඳුන්වනු ලැබේ. මෙකී අත්දැකීම් ඇසීමෙන්, දැකීමෙන්, කියවීමෙන්, ඇසුරෙන් ආදි විවිධ ක්‍රම මගින් ඔහුගේ සිතට පිවිසෙයි. එම අත්දැකීම් පරිකල්පනය මගින් පෝෂණය කිරීම තුළින් කතාව බිහිවෙයි. කතාවේ සාර්ථක අසාර්ථක බව ඇතිවන්නේ මේ මගිනි. තවත් අතකින් කිවහොත් අත්දැකීමට දෙන කලාත්මක විකාශය අනුව ය. මෙහි දී දැක්වූ විකාශය යන්න කෙටිකතා කලාවෙහි ලා ඉතා වැදගත් වන්නකි. ඒ සඳහා ඔහුට චරිත අවශ්‍ය වෙයි. එම සිද්ධි පසුබිම් කොට ගත් අවස්ථා අවශ්‍ය වෙයි.

මේ සියල්ල අත්දැකීම් වටා සිතීමෙන් කතාකරුවා උපදවා ගන්නා මෙවලම් ය. සැබැවින් ම කතාකරුවෙකුගේ නිර්මාණ කුසලතාව යනු අත්දැකීම් නො වේ. අත්දැකීම බැහැරින් ලබා ගන්නකි. ස්වාධීනත්වයක් නැතහොත් තමන් සතු බවක් එහි නැත. එහෙත් ඉහත කී අත්දැකීම්

වටා කතාකරු විසින් ගොනු කරනු ලබන චරිත සිද්ධි අවස්ථා ස්වාධීන ය. ඒවා නිර්මාණශීලී වූ විට හොඳ කතාවකුත් නිර්මාණශිලී නො වූ විට දුර්වල කතාවකුත් අපට ලැබෙයි. ඉහත කී මෙවලම් උපයෝගී කර ගෙන පාඨකයා වසඟයට ගැනීමේ බලය ලබා දෙන්නේ කුතුහලය මගිනි. සෑම සාර්ථක කෙටිකතාවක ම කතාවේ අවසානය තෙක් කුතහලය රඳවා තබා ගත යුතුයි. ප්‍රබුද්ධ ලේඛකයන් කුතුහලය යොදා ගනු ලබන්නේ නිරතුරුව ම කතාවේ කලාත්මක භාවයට හානි නොවන ආකාරයෙනි.

(ලකුණු 10 යි)

(04) පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මිනිස් හඬ වා රැළ තවත් නැත  කිළිටි රා දොස් මෝ මුළායෙන්
සුනිල් වන පෙත නුවන සනහන  රුධිර පවසැති මිනිස් අතකින්
අඩක් කාලයේ පසට යටවුණු  කඩා රැස් කළ කුසුම් කුමට ද
ඇහැටු පැළ පෙඳ පාසි උසුලන  කුමන පලය ද කිළිටි බතකින්
සියක් වස් කොපමණ ද නොදනිමි  පිදීමට මාගේ අවිහිංසාවාදී පියාණන්
මලක් පහනක් දිටියෙ පුදසුන  වියළි පතකින්, ඇහැටු පෙඳ පාසියෙන් බැරි ඇයි?

(i) මෙහි කියැවෙන පුදබිම පිහිටි පරිසරයේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) පුදසුනේ කොපමණ කාලයක් මල් පහන් පූජා කොට නැති ද?

(iii) කවියා පලක් නැති ලෙස දකින්නේ කෙබඳු පූජා භාණ්ඩ ද?

(iv) පූජා කිරීම සඳහා කවියා යෝජනා කරන්නේ කවර දේ ද?

(v) පද්‍යයේ සඳහන් පහත දැක්වෙන පදවල අර්ථ පහදන්න.

(අ) රා -

(ආ) දොස් -

(ලකුණු 10 යි)

(05) පවුල් 450 ක් පමණ ජීවත් වන හිඹුටු උයන ගම්වාසීන්ට මහත් ගැටලුවක් වී ඇත්තේ ආසන්නයේ පිහිටා ඇති ප්‍රාදේශිය රෝහලේ අපද්‍රව්‍ය පුලුස්සා දැමීමේ ක්‍රියාදාමය යි. එකී අපද්‍රව්‍ය පුලුස්සා එහි දුම බටයක් ඔස්සේ මුදා හරී. දිවා රාත්‍රී දෙකෙහි ම පිටවන මෙම දුම නිසා ප්‍රදේශයේ ජනතාව විවිධ ස්වසන රෝගවලට ගොදුරු වෙති. ඔබ, ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම්වරයා යැයි සිතා මේ පිළිබඳ ව සඳහන් කරමින් විකල්ප විසඳුම් මාර්ගයක් යෝජනා කරමින් ප්‍රාදේශීය සෞඛ්‍ය අධිකාරීතුමාට යවන රාජකාරී ලිපිය ලියන්න.

- නැතහොත් -

පහත දී ඇති ප්‍රවෘත්තිය ඇසුරින් විශේෂාංග ලිපියක් සකසන්න.

ගල්ගමුව ප්‍රදේශයේ පාසල් සිසුවෙකු වන දම්සිත් ගුණරත්න මෑතක දී ස්වයංක්‍රීය විදුලි වැටක් නිර්මාණය කළේ ය. වන අලින්ගේ ජීවිතවලට හානියක් නො වී උන් පලවා හැරීම සඳහා ම විශේෂිත වූ මේ ක්‍රමය මගින් මිනිස් ජීවිතවලට හානි සිදු නො වීම අගය කළ යුතු කරුණකි. ඉවත දමන කම්බි හා බැටරි මගින් ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයේ පවතින මෙය නවීන තාක්ෂණය යොදා වැඩි දියුණු කර ගත හැකි වේ නම් තවත් ප්‍රයෝජන ලබාගත හැකි බව ඔහුගේ අදහස යි.

(ලකුණු 15 යි)